# ගෙදර අවතාරය



ඩෙනුලි ලාවන්‍යා අතුකෝරල

# ගෙදර අවතාරය

කථාව හා චිත්‍ර
ඩෙනුලි ලාවන්‍යා අතුකෝරල

ISBN – 978-624-206-797-1

# පිදුම

අකුරු සතර කියාදෙමින්

යහමගට මා යැවීමට

හැමවිටම වෙහෙසෙන

මහමායා විදුහල් මෑණියන්ට

මෙය පුදමි !!!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 10 20

එදා අයියාට චෙස් ක්‍රීඩා පුහුණු දවසක්. අයියා පාසල් වේලාවෙන් පසුව චෙස් ක්‍රීඩා පුහුණුව සඳහා පාසලේ නැවතුණා. අම්මයි මමයි ගෙදර ආවා.

අපේ ගෙදර පිහිටා තිබුණේ කඳු මුදුනකය. අවට අසිරිය හොඳින් පෙනෙන අපේ ගෙදර අවට වෙනත් ගෙවල් අඩු නිසා මදක් පාළු බවක් දැනුණද, එම නිස්කලංක බවට නිවසට එන කවුරුත් කැමැත්තක් දක්වති.



එදා හවස පහයි තිහ විතර වෙද්දි අම්මා මාව ගෙදර නවතා අයියාව රැගෙන ඒමට පිටත් වීමට සූදානම් වුණා.

" අම්මා මාව දාලාද යන්නේ " ?

මම අම්මාගෙන් ඇහුවා.

"ඔව් පුතේ, ලොකු වැස්සක් අත ළඟ.

ඔයාව එක්කන් ගියොත් තෙමෙයි.

ගේ ඇතුළට වෙලා පරිස්සමෙන් ඉන්න.

මම එනතුරු දොර අරින්න එපා.".

අම්මා කිව්වා.



මම දොර අගුළු දාලා වැහුවා. පාසලෙන් ලබා දුන් ගෙදර වැඩ කරන්න පටන් ගත්තා.

ටික වේලාවකින් මහා හයියෙන් වහින්න පටන් ගත්තා. විදුලි කෙටුවා, අකුණු ගැහුවා, විදුලියත් විසන්ධි වුණා.අවට හරිම කළුවරයි.

මම තනියම. මට හරියට බය හිතුණා.

මගේ ඇස් දෙකට කඳුළු පිරුණා.

මොනව කරන්නද ?

අනේ !

අම්මා ඉක්මනට එනවා නම් කියා මට හිතුණා.



මම අසල තිබූ පුටුවක වාඩි වී ඇස් පියා ගත්තා.

" දඩාං "

ලොකු ශබ්දයක් කුස්සිය පැත්තෙන්,

දැන් නම් මට තවත් බය හිතුණා .

මාව හොඳටම වෙව්ලුවා .

මම කකුල් දෙකත් පුටුව උඩට අරගත්තා.

අනේ !

මම මොකද දැන් කරන්නේ ?

මම හිමිහිට ඇස් ඇරියා.



අනේ දෙවියනේ ! සුදු පාට අවතාරයක් !

කුස්සිය පැත්තට යනවා දැක්කා.

මම ඇස් තදින්ම පියාගෙන හොඳටම ඇඬුවා.

ඒත් එක්කම කුස්සියේ බඩු පෙරළෙන ශබ්දයක් ඇසුණා. මොනවාහරි හූරන ශබ්දයකුත් ඇසුණා.

ටික වේලාවකින් ඒ ශබ්දය නතර වුණා.

ඒත් එක්කම මීයෝ කෑ ගහන ශබ්දයක් වගේ ඇහුණා.

මම පාසලේ කුඩා මිතුරියක්.

මගේ ගුරුතුමී කියා තිබෙන්නේ,

කුඩා මිතුරියක් නිර්භීත විය යුතු බවත් අවංක විය යුතු බවත්ය.

මම හිතුවා බය නැති කරගන්න,

විදුලි පන්දමත් අරගෙන නිර්භීතව කුස්සියට ගියා.



කවුරුත්ම පේන්නට හිටියේ නෑ.

මට හරි පුදුමයි.

ඒත් අපේ සුදු පූසි පැටව් දාලා ඉන්නවා මම දැක්කා.

මට හිතාගන්න බෑ.

මම බයවෙලා තියෙන්නේ පූසිටද ?

මට හරි සතුටක් දැනුණා.

අනේ !

හරි ලස්සන පූස් පැටව්.



මම කල්පනා කළා මට පෙනුණ අවතාරය මොකක්ද කියලා.

එතකොටම මට තවත් සද්දයක් ඇසුණා.


සාලයේ දොරට තට්ටු කරනවා.

මට ආයෙත් ටිකක් බය හිතුණා.

ඒත් නිර්භීතව සාලයට ගිහින් ජනේලයෙන් බැලුවා.

මම දැක්කා අම්මයි අයියයි දොර ළඟ ඉන්නවා.

එයාලා හොඳටම තෙමිලා.



මම දොර ඇරලා අම්මා ළඟට ගියා.
අම්මවයි අයියවයි ගේ ඇතුළට එක්කන් ආවා.
මම සේරම විස්තරේ අම්මටයි අයියටයි කිව්වා.
අයියා හොඳටම හිනා වුණා.
අම්මා සිනාසෙමින් විත් මාව බදා ගත්තා,
අම්මාගේ උණුසුම මට දැනුණා.



‘‘අවතාර කියලා දෙයක් නෑ.

හිත බය වුණාම අපිට හැම දේම අවතාර වගේ තමයි පේන්නේ.’’

එදා අම්මා මාව තුරුළු කරගෙන කියලා දුන්නා.

අදටත් මට ඒ සිදුවීම මතක් වන විට හරි හිනා !



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට කුඩුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 10 20